සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved 2024.02.27

Learning Resource Centre
De Mazenod College
Kandana

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

9365

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 3 යි |

නම / பெயர் / Name ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...............................

## I - කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

01. දේව වේදීය ඉතිහාස කථා ලෙස හැඳින්විය හැක්කේ
 1. නව ගිවිසුමේ ශුභාරංචි පොත්ය 2. පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත්ය
 3. පංච පුස්තකයය 4. එළිදරව් සාහිත්‍යය

02. ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස සලකනු ලබන්නේ
 1. එළිදරව් ග්‍රන්ථය වේ 2. ගලාති ලිපිය වේ
 3. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත වේ 4. භගවත් ගීතාව වේ

03. ද්විතීය පාවුලු සංදේශයක් නොවේ,
 1. 1 තිමති 2. එපීස 3. කොලොස්සි 4. 2 තෙසලෝනික

04. දේව ආදරයේ හා ක්‍රිස්තුස්වහන්සේගේ කීකරුකමේ සංකේතය
 1. ජපමාලයයි 2. ශුද්ධ බයිබලයයි 3. පාද දෝවනයයි 4. කුරුසියයි

05. පරිපූර්ණත්වය හඟවනු ලබන සංඛ්‍යා සංකේතය
 1. 4 2. 7 3. 10 4. 12

06. යෞවනයන් පුහුණු කිරීම අරමුණු කරගනිමින් සමාජයේ ප්‍රභූ පන්තිය සඳහා වූ ප්‍රඥාව වන්නේ,
 1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව 2. රාජ්‍ය සභා ප්‍රඥාව
 3. අභිධාර්මික ප්‍රඥාව 4. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව

07. ජනතාවගේ ඉල්ලීමට අනුව නිදහස් කරනු ලැබුවේ
 1. ජේසුස් වහන්සේවය 2. බරබ්බාස්වය 3. පිලාත්වය 4. පේදුරුතුමාවය

08. පාස්කු ඉරුදින ගෝලයන් දෙදෙනෙක් ජෙරුසලමේ සිට ගමන් කරමින් සිටියේ,
 1. එම්මාවුස් ගමටය 2. ජෙරිකෝවටය 3. ජුදයාවටය 4. කයිසාරියටය

09. අදහා බෞතිස්මය ලැබූ ඉතාලි භට හමුදාවේ ශතාධිපතියා වූයේ,
 1. සකේවුස්ය 2. කොර්නේලියස්ය 3. අර්කෙලාවුස්ය 4. අරමාතියාවේ ජෝශප්ය

10. ශුද්ධ වූ සභාව පැතිරවීමට සුළු ආසියාවේ සිට ග්‍රීසිය හා රෝමය දක්වා ගමන් කළ අසහාය ධර්මදූතවරයා වන්නේ,
 1. ශුද්ධ වූ පාවුලු තුමාය 2. ශුද්ධ වූ පේදුරුතුමාය
 3. ශුද්ධ වූ ජාකොබ් තුමාය 4. ශුද්ධ වූ ෆ්‍රැන්සිස්තුමාය

11. "බිය නොවන්න මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැයි" ජේසුස් වහන්සේ පැවසූවේ,
 1. ජුවාම් තුමාටය 2. ජුදාස්ටය 3. පාවුලු තුමාටය 4. පේදුරු තුමාටය

12. "ජෝර්ජ් මාරියෝ බර්ගලියෝ" නම් මුල් නාමය හිමි ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
 1. 2වන ජුවාම් පාවුලු මුනිතුමන්ය 2. XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ය
 3. VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමන්ය 4. 1 වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ය

13. ''මා මෙසේ කරන්නේ ඔබ මා තුළද මා ඔබ තුළද සිටින්නාක් මෙන්, ඔවුන්ද අප තුළ ඒකත්වයක් වන පිණිසය.''
මෙසේ සඳහන්ව ඇත්තේ,
1. මතෙව් ශුභාරංචියේය
2. මාක් ශුභාරංචියේය
3. ජුවාම් භුභාරංචියේය
4. ලූක් භුභාරංචියේය

14. පේදුරුතුමාගේ අනුප්‍රාප්තිකයන් හා රදගුරුතුමන්ලා විසින් කතෝලික සභාව පාලනය වන බව ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රණ සභාව වනුයේ,
1. 1 වෙනි වතිකානු මන්ත්‍රණසභාව
2. දෙවන වතිකානු මන්ත්‍රණසභාව
3. ත්‍රිදෙන්තීන මන්ත්‍රණ සභාව
4. නිසියානු මන්ත්‍රණ සභාව

15. ''එවිට ඔබ ජෙරුසලමෙහිද ............... හා ............. ද පොළොවේ සීමාන්තයන් දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුය'' (ක්‍රියා 1:8) මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. ජුදයාව, සමාරිය
2. රෝමය, ග්‍රීසිය
3. ජුදයාව ගලීලය
4. ඇමෙරිකාව, යුරෝපය

16. බ්‍රිතාන්‍ය යුගය ලෙස හඳුන්වනු ලබන්නේ
1. ක්‍රි.ව. 1505ට පෙරය
2. ක්‍රි.ව. 1505 - 1658 ය
3. ක්‍රි.ව. 1658 - 1796 ය
4. ක්‍රි. ව. 1796 - 1948 ය

17. ක්‍රි. ව. 1651 අප්‍රියෙල් මස 21 වන දින ඉන්දියාව ගෝව ප්‍රදේශයේ උපත ලැබුවේ,
1. තෙරේසා මව්තුමිය
2. ෆ්‍රැන්සිස්තුමාය
3. ජුසේවාස් පියතුමාය
4. ගොන්සාල්වෙස් පියතුමාය

18. කතෝලිකයන්ට පනවා තිබූ සියලු නීති අවලංගු කර කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබුවේ,
1. බ්‍රිතාන්‍ය යුගයේදිය
2. පෘතුගීසි යුගයේදිය
3. ලන්දේසි යුගයේදිය
4. නිදහසින් පසු යුගයේදී ය.

19. දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නොවන නමකි,
1. පූප කැඩීම
2. ස්වාමීන් වහන්සේගේ රාත්‍රි භෝජනය
3. මන්නා භෝජනය
4. නව පාස්කු මංගල්‍යය

20. ජේසුස්වහන්සේගේ රුධිර වර්ගය ලෙස පිළිගනු ලබන්නේ,
1. O පොසිටිව්ය
2. A නෙගෙටිව්ය
3. B පොසිටිව්ය
4. AB පොසිටිව්ය

21. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ඇති විට කිතුණු අප,
1. හිස නමා නමස්කාර කළයුතු වෙමු.
2. දණ නමා නමස්කාර කළ යුතු වෙමු.
3. දෑත් වැඳ නමස්කාර කළයුතු වෙමු.
4. දෙදණ නමා නමස්කාර කළයුතු වෙමු.

22. ජුදෙව්වන් වසරක් පාසා උත්සවාකාරයෙන් පැවැත්වූ මංගල්‍යය,
1. කුඩාරම් මංගල්‍යය
2. පාස්කු මංගල්‍යය
3. අස්වැන්න නෙළීමේ මංගල්‍යය
4. නත්තල් මංගල්‍යය

23. ජාතීන්ගේ විනිශ්චය දිනයේ ක්‍රිස්තුස්වහන්සේ යොදා ගන්නා මිනුම් දණ්ඩ වන්නේ,
1. ශාරීරික පුණ්‍ය ක්‍රියා
2. ආත්මික පුණ්‍යක්‍රියා
3. මුල් අගුණ පව්
4. භාග්‍ය අට

24. ''කැරොල් වොයටිල්ලා'' නම් මුල් නාමය හිමිකරගත් පෝලන්ත ජාතික සුදතුම් පියා වන්නේ,
1. පළවන ජුවාම් පාවුලු සුදතුම් පියා
2. හයවන පාවුලු සුදතුම් පියා
3. දෙවන ජුවාම් පාවුලු සුදතුම් පියා
4. පළවන ෆ්‍රැන්සිස් සුදතුම් පියා

25. නැගෙනහිර හා බටහිර ජර්මනිය වෙන්කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වූයේ,
1. ඇමෙරිකානු ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන්ය
2. ජර්මන් ජනාධිපති ෆ්‍රැන්ක් වෝල්ටර්ය
3. දෙවන ජුවාම්පාවුලු සුදතුම් පියාණන්ය
4. 23 වන ජුවාම් සුදතුම් පියාණන්ය

26. තෙරේසා මව්තුමිය ආරම්භ කළ පැවිදි නිකාය
1. ලොරෙටෝ පැවිදි නිකාය
2. දයාවේ දූතිකාවේ පැවිදි නිකාය
3. යහපත් එඬේරා පැවිදි නිකාය
4. ඔරතෝරියානු පැවිදි නිකාය

27. ''නමෝ මරිය'' කියමින් ජීවිතයෙන් සමුගත්තේ,
1. තෙරේසා මව්තුමිය  2. ගොන්සාල්වෙස් පියතුමා
3. මයිකල් රුද්‍රිගු පියතුමා  4. මැක්සිමිලියන් කොල්බේතුමා

28. ගරු. මයිකල් රුද්‍රිගු පියතුමා අයත් පැවිදි නිකාය
1. නිර්මල මරිය නිකාය  2. ජේසු නිකාය
3. ෆ්‍රැන්සිස්කන් නිකාය  4. දොමිනිකාන නිකාය

29. සැම අභියෝගයකදීම දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ නව ගිවිසුමේ කාන්තාව
1. ආබ්‍රහම් තුමා  2. ජෝබ්  3. හන්නා  4. මරියතුමිය

30. ''ඔබේ මව විඳි ප්‍රසව වේදනාව කිසි දිනෙක අමතක නොකරන්න'' යනුවෙන් අපට අවදි කරවන ශුද්ධ බයිබලීය ග්‍රන්ථය
1. එපීස ලිපිය  2. නික්මයාම පොත
3. උපදේශකයා හෙවත් සිරාක්  4. හිතෝපදේශය

31. තමාගේ සහෝදරයාට 'මෝඩයා' කියා ගරහන කවරකු වුවද යටත් වනුයේ,
1. විනිශ්චයට  2. අධිකරණයට  3. ශ්‍රේෂ්ඨාධිකරණයට  4. නිරාගින්නට

32. තමාටත් අසල්වැසියාටත් දෙවියන්වහන්සේටත් විරුද්ධව කරන පාපය
1. සියදිවි නසාගැනීම  2. සල්ලාලකම  3. ගබ්සාව  4. මිනී මැරීම

33. දෙවියන්වහන්සේගේ පරම සත්‍යයේ පූර්ණත්වය විද්‍යාමාන වූයේ,
1. මරියතුමිය තුළින්ය  2. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළය
3. ආබ්‍රහම්තුමා තුළය  4. මෝසස්තුමා තුළය

34. ජනවන්දනා වර්ෂයක් සමන්විත වන සති ගණන
1. 36 කි  2. 12 කි  3. 46 කි  4. 52 කි

35. නිල වශයෙන් ජනවන්දනා වර්ෂය ආරම්භ වන්නේ
1. සාමාන්‍ය සමයෙනි  2. ආගමන කාලයෙනි  3. නත්තල් කාලයෙනි  4. පාස්කු කාලයෙනි

36. චතාරික සහ ආගමන කාලයේ ගායනා නොකරයි
1. සුරදූත ගීය  2. පරමණ්ඩල යැදුම  3. විශ්වාස ලක්ෂණය  4. ආලේලුයියා

37. ජේසුස්ක්‍රිස්තුස් වහන්සේ තෝරාගත් ශ්‍රාවකයන් අයිති
1. මරියතුමියටය  2. ශුද්ධාත්මයාණන්ට
3. දෙවියන්වහන්සේට ය  4. ජේසුස්වහන්සේටය

38. ජේසුස්වහන්සේ ගෙත්සෙමන උයනේ යාච්ඤා කරන්නට ගිය අයෙකු නොවේ:
1. ජුදාස්  2. පේදුරු  3. ජුවාම්  4. ජාකොබ්

39. මල් උයන කියන්නේ
1. ජෙරුසලමටය  2. ගෙත්සෙමනටය  3. ගලීලයටය  4. සුගති උයනටය

40. ශ්‍රාවකයන් ජේසුස්වහන්සේව අතහැර පලාගියේ,
1. පරීක්ෂාවට වැටුණ නිසාය  2. භය වූ නිසාය
3. ජේසුස් වහන්සේට ආදරය නොකළ නිසාය  4. යාච්ඤාවෙන් ශක්තිය ලබා නොගත් නිසාය

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් සමග ප්‍රශ්න 5ට පිළිතුරු සැපයිය යුතුවේ.

---

1. i. ශුද්ධ බයිබලයේ නීති පොත් 2ක් නම් කරන්න.
   ii. ශුද්ධවූ පාවුලුතුමා ලිපි ලිවීමේ පරමාර්ථ 2ක් ලියන්න.
   iii. ප්‍රඥාව ඉදිරිපත් කරන සාහිත්‍යමය ස්වරූප 2ක් නම් කරන්න.
   iv. ජුසේවාස් පියතුමන්ගේ මව්පියන් නම් කරන්න.
   v. චතාරික සමය ආරම්භ වන්නේ කවදා ද?
   vi. ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජනවන්දනා දින 2ක් නම් කරන්න.
   vii.. රතු වර්ණය භාවිතා කරන දින 2ක් නම් කරන්න.
   viii. ක්‍රිස්තුස්වහන්සේව ප්‍රශංසනාත්මකව පිළිගනු ලබන්නේ දේව වාක්‍ය පිළිවෙතේ කුමන කොටසේදී ද?
   ix. කිතුනු ජීවිතයේ අනිවාර්යය අංගයක් විය යුත්තේ කුමක් ද?
   x. උත්තම පූජක යැදුම හා මල් උයනේ යැදුම සඳහන් සුභාරංචි ග්‍රන්ථ 2 වෙන වෙනම නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

2. i. ලෞකික සැප සම්පත් නොව ප්‍රඥාව පමණක් ඉල්ලූ රජතුමා කවුද? (ලකුණු 02)
   ii. ආණ්ඩුකාර පිලාත් ඉදිරියේ ජේසුස්වහන්සේට විරුද්ධව නැගූ චෝදනා 3ක් ලියන්න. (ලකුණු 03)
   iii. සත්‍යවාදිව කටයුතු කිරීමට ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 5ක් ලියන්න. (ලකුණු 05)

3. i. ශුද්ධාත්ම වරමින් පූර්ණවී අභියෝග හමුවේ විශ්වාසයට සාක්ෂි දරමින් පරිණත කිතුනුවන් ලෙස ක්‍රියා කිරීමට වරම් ලබන සක්‍රමේන්තුව නම් කරන්න. (ලකුණු 02)
   ii. තම ධර්මදූතචාරිකා වලදී පාවුලුතුමා මුහුණදුන් අභියෝග/ බාධා 3ක් ලියන්න. (ලකුණු 03)
   iii. සුභාරංචිය පතළ කිරීම සඳහා පරිණත කිතුනුවකු ලෙස කළ හැකි කාර්යයන් 5ක් ලියන්න. (ලකුණු 05)

4. i. ශ්‍රී ලංකාවේ රදගුරු පදවි 2ක් නම් කරන්න. (ලකුණු 02)
   ii. ශුද්ධවූ ත්‍රිත්වය නම් කරන්න (ලකුණු 03)
   iii. ශුද්ධවූ සභාවේ උන්නතිය උදෙසා කිවහැකි විශ්වාසික යැදුමක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

5. i. දෙවියන්වහන්සේට දක්වන ගෞරවයේ සහ ප්‍රේමයේ සළකුණ මොනවාද? (ලකුණු 02)
   ii. තුන්වන පණතට විරුද්ධ ක්‍රියා 3ක් ලියන්නන. (ලකුණු 03)
   iii. දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ දෙමාපියන් සතු වගකීම් 5 ක් ලියන්න. (ලකුණු 05)

6. i. ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ හිස සහ අවයව කවුරුන්දැයි නම් කරන්න. (ලකුණු 02)
   ii. ජනවන්දනාවේ ප්‍රධාන අංග 3 නම් කරන්න. (ලකුණු 03)
   iii. යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීමට අනුගමනය කළයුතු ක්‍රියාකාරකම් 5ක් ලියන්න. (ලකුණු 05)

7. පහත සඳහන් මාතෘකා අතරින් තෝරාගත් මාතෘකා 2ක් පිළිබඳව ලියා දක්වන්න.
   i. ස්වාමිවක් ආරාධනා යැදුම
   ii. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
   iii. ශුද්ධ වූ තෙරේසා මුනිවරිය
   iv. ශුද්ධ වූ පාවුලු තුමා

(ලකුණු 2 × 5 = 10)